2021.අප්‍රේල්. 20

හිටපු ජනාධිපතිනි
ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය,
අංක 27 නිදහස් මාවත,
කොළඹ.

ගරු මැතිනියණි,

**<u>2021.03.27 දින මාවෙත යොමුකරන ලද 2021 .04.05 දින පැවැත්වීමට යෝජිත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමස්ත ලංකා කාරක සභා රැස්වීම පැවැත්වීම අවලංගු කරන ලෙස දැන්වීම සහිත ලිපිය පිළිබඳවයි</u>**

**ලැබුවා වූ සිංහල හා දමිල අළුත් අවුරුද්ද සුබ නව වසරක් වේවායි** පලමුව ප්‍රාර්ථනාකරමින් ,ඔබතුමිය විසින් මාවෙත එවන ලද ඉහත මාතෘකාව සහිත ලිපිය ලද බව කාරුණිකව දැනුම්දෙමි.

1. අප පක්ෂයේ ව්‍යවස්ථාවේ 12(1) (i) අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විධායක ජනාධිපති ධූරයට පත්ව එකී ධූරකාලය අවසන්කල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකුවන ජනාධිපතිවරයා හෝ ජනාධිපතිවරුන් නිල බලයෙන් අනුශාසක ධූරයට හෝ ධූරයන්ට පත්කරණ බව මම දනිමි.
2. පක්ෂයේ ව්‍යවස්ථාවේ ii (viii) වගන්තිය අනුව එවැනි අයකු විධායකසභාවේ සමාජිකයකු වන බවද මම දනිමි.

නමුත් ගරු මැතිණියනි, පසුගිය 2019 ජනාධිපතිවරණයෙන් පසුව පැවැති පක්ෂයේ උත්තරීතර මණ්ඩලය වන දේශපාලන මණ්ඩලයේදීත් , පක්ෂයේ මධ්‍යම කාරක සභාවේදීත් , 2019 ජනාධිපතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ලෙස අප පක්ෂය ජනාධිපති අපේක්ෂක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට සහයෝගය ලබාදීමට ගත් පියවරයට එරෙහිව කටයුතුකල අයට එරෙහිව ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳව සාකච්ජා කර තිබේ.

2019 .11.21.පක්ෂයේ මධ්‍යම කාරක සභාවේදී පක්ෂයේ මතයට එරෙහිව කටයුතුකල පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ආසන සංවිධායකවරු, දිස්ත්‍රික් සංවිධායකවරු , හා පලාත්පාලන මන්ත්‍රීවරු ඇතුලත්ව පක්ෂයේ නිලතල

දරන්නන්ට එරෙහිව තරාතිරම නොබලා විනය පරීක්ෂණ කැදවා ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, එයට සම්බන්ධ වු ආසන සංවිධායකවරු හෝ දිස්ත්‍රික් සංවිධායකවරු ඉවත්කොට නව සංවිධායකවරු පත්කිරීමටත් තීරණය කරණ ලදී.

එසේම 2020.01.16. දින පැවැති මධ්‍යම කාරක සභා රැස්වීමේදී මෙම තීරණය තවදුරටත් සාකච්ඡාකර අනුමත කරමින් ඉදිරිපියවර ගැනීමට තීන්දුකරණ ලදී. මෙම තීරණය මත ඔබ තුමියගේ නායකත්වයෙන් යුතුව 2019.11.05 දින සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේ දී එක්සත් ජාතික පෙරමුණෙහි ජනාධිපති අපේක්ෂක සජිත් ප්‍රේමදාස මැතිතුමාට සහයෝගය දැක්වීමට සංවිධානය කල " **අපි ශ්‍රී ලංකා"** සංවිධානය විසින් මෙහෙයවු රැස්වීම සංවිධානයකල හා එයට සහභාගී වූ අයද, එසේම 2019.11.01 දින ටාජ් සමුද්‍ර හෝටලයේදී ඔබ තුමියද සහභාගී වු උත්සව සභාවක එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මීනුවන්ගොඩ ආසන සංවිධායක ලෙස සිටි රුවන් රණතුංග මහතාද අත්සන් කරන්නට යෙදුන අවබෝධතාගිවිසුම අත්සන්කරන අවස්ථාවට සහභාගීවු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආසන සංවිධායකවරු හා දිස්ත්‍රික් සංවිධායකවරුද ඇතුලත්ව 26 දෙනෙකු එම තනතුරුවලින් ඉවත්කර ලිපි යැවීමට මාහට බලය ලබාදෙන ලද අතර ඒ අනුව මා ක්‍රියාකරනු ලැබීය.
මීට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්වු විජිත් විජයමුණි සොයිසා මැතිතුමා හා ඒ .එච්. එම් ෆවුසි මැතිතුමාට එරෙහිව විනය පරීක්ෂණ පවත්වා පක්ෂයයෙන් නෙරපනු ලැබු අතර ඔවුන් පසුව අධිකරණයෙහි නඩු පවරනු ලැබීය .

මීට අමතරව පලාත් පාලන ආයතන නියෝජිතයන් ගණනාවක් විනය පරීක්ෂන පවත්වා පක්ෂයේන් නෙරපා දැමු අතර තවත් කිහිප දෙනෙකුට එරෙහිව තවදුරටත් විනය කටයුතු පැවැත්වෙමින් තිබේ.

පක්ෂයේ තීන්දුවලට පටහැනිව ක්‍රියාකල අයහට අත්වන ඉරණම මෙය බව හසල දේශපාලන අත්දැකීමක් ඇති ඔබතුමිය මට වඩා හොඳින් දන්නාබව මම විශ්වාස කරමි.

පක්ෂයේ විනය සෑම දෙනෙකුටම සමාන විය යුතුය යන්න ඔබ තුමිය හොඳින්ම වටහාගෙන ඇතැයි මම විශ්වාස කරමි.පක්ෂයේ දේශපාලන මණ්ඩලය, විධායක සභාවද, සමස්ථ ලංකා කාරක සභාව සහ පක්ෂයේ සම්මෙලනයේදී ගත් තින්දු හා තීරණයන් අනුව 2019 ජනාධිපතිවරණයේදී අප පක්ෂය ගෝඨාභය රාජපක්ෂ මහතාට සහයෝගය දියයුතුයැයි තීරණය කර තිබියදී ඊට එරෙහිව යමින් වෙනත් අපේක්ෂයකුට සහයෝගය ලබාදීම හා ඒ වෙනුවෙන් පිරිස් පෙළඹවීම හා සංවිධානය කිරීමද එයට නායකත්වය ගැනීමද පක්ෂයේ විනය බරපතල ලෙස උල්ලංඝණය කිරීමකි.

බලවතුන්ට එක නීතියකුත් සාමාන්‍ය අයට තව නීතියකුත් යන ලෙස නීතිදෙකක් පක්ෂයක් තුල පැවතිය නොහැක.එබැවින් ඉහත සදහන් කල අයට එරෙහිව ගත් තීරණයම ඔබතුමියටද එකසේ අදාල වන බව නීතිඥවරයකු ලෙස මාගේ අදහසයි.

පක්ෂයේ රැස්වීම් හා වෙනත් කටයුතු සදහා මා ඔබතුමිය වෙත ආරාධනා නොකිරීම පක්ෂය විනාශකිරීම සදහා මා විසින් සිදුකරණ කුමන්ත්‍රණකාරී කටයුත්තක් ලෙස දක්වමින් මා හට චෝදනා කිරීම පසෙකලා හෘදසාක්ෂියට එකගව සත්‍ය තත්වය අවබෝධකරගන්නා ලෙස කාරුණිකව ඉල්ලාසිටිමි.පක්ෂය දැවැන්ත අභියෝගාත්මක යුගයක් ගත කරමින් සිටින මෙම මොහොතේදී මා කරමින් සිටින්නේ පක්ෂය විනාශ කිරීම නොව පිටතින් සිටින කුමන්ත්‍රණ කරුවන්ගෙන් පක්ෂය බේරාගෙන පක්ෂය නැවත ගොඩනැගීමට ක්‍රියා කරමින් පක්ෂයේ ගරු සභාපතිතුමා ඇතුලු නිලධාරී මණ්ඩලයේද ලක්ෂ සංඛ්‍යාත පාක්ෂිකයන්ගේද බලාපොරොත්තු සහගත නොනිමි අරගලයට අවශ්‍ය ජවය හා ශක්තිය ලබාදීමයි.

දැනට සිදුව තිබෙන්නේ ඔබතුමියට අප පක්ෂයේ නිල කටයුතු සදහා ආරාධනා නොකිරීම පමණකි.එය මාගේ පුද්ගලික තීරණයක් නොවන බවත් එය සියලු තනතුරුලාභීන්ටද අදාල වන ලෙස මධ්‍යම කාරක සභාව ගෙන ඇති තීරණයක් ක්‍රියාත්මක කිරීමක් පමණක් බවත් දැනුම්දෙමි.

මෙපමණ කාලයක් මාධ්‍ය විසින් මෙම කරුණ අරභයා මාගෙන් ප්‍රශ්න කිරීමේදී මා විසින් ඉතා කල්පනාකාරීව පිළිතුරු ලබාදුන්නේ ඉහත තත්වයන් සියල්ලද තවත් කරුණු රැසක් පිළිබදවද මනා අවබෝධයෙන් යුතුව බව ඔබ තුමියට දැනුම්දීමට කැමැත්තෙමි.

එක් අතෙකින් ඔබ තුමිය අවුරුදු 17 ක දූෂිත එක්සත් ජාතික පක්ෂ පාලනයෙන් රට මුදවාගෙන අප පක්ෂය බලයට ගෙන ඒමට ක්‍රියාකල අභීත නායිකාවකි.එසේම ඔබතුමියද නායකත්වය දැරූ ඔබ තුමිය අනුශාසක වරියක් ලෙස කටයුතුකරණ පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ගන්නාලද තීන්දුවට එරෙහිවකටයුතු කරන ලද සාමාජිකාවකි.පක්ෂයේ විනය කඩකිරීමක් දරන ලද තනතුරු හා විශිෂ්ඨක්‍රියාකාරිත්වයට හිලව්කල යුතුද?

එබැවින් ඔබ තුමිය නොකැදවමින් මාගේ හිතවතුන් කැදවමින් මට වාසිදායක තීන්දු ගැනීමට මා ක්‍රියාකරමින් සිටින්නේය යන චෝදනාව සම්පූර්ණ අසත්‍යයක් බැවින් එම චෝදනාව තරයේ ප්‍රතික්ෂේප කරමි.මාහට වාසිදායක හා මට උවමනා තීරණ පක්ෂය තුල ගන්නේයැයි යනුවෙන් කරන ලද කරුනු දැක්වීම පක්ෂයේ තීරණ ගන්නා අයවලුන් දැඩි අපහසුතාවයකට පත්කිරීමක් වන අතර ඔවුන්ව අපහාසයකට ලක්කිරීමකි.අප පක්ෂයේ සභාපති තුමා ප්‍රධාන සියලු නිලධාරීන් හා මධ්‍ය කාරක සභාව එවන් අපහාසයකට කිසිවිටෙකත් ලක් නොවිය යුතුය.

මෙම තත්වයන් තුල ඔබතුමිය හා සබැදි විමසීම්වලදී "එතුමිය නැවත අප පක්ෂයට එකතුකරගන්නවා" යන්න හැර මට කීමට ඇත්තේ කුමක්ද?පක්ෂයේ ප්‍රධාන තනතුරු දරන්නන් පක්ෂයේ තීන්දුවලට එරෙහිව කටයුතු කරණවිට, පක්ෂය කඩා නව පක්ෂ ගොඩනගනවිට, ඔවුන් සම්බන්ධයෙන් එක නීතියකුත් ඔවුන් පසුපස ගොස් අනාථභාවයට පත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, පළාත්සභා මන්ත්‍රීවරුන්ට , ආසන සංවිධායකවරුන්ට , දිස්ත්‍රික් සංවිධායකවරුන්ට හා පළාත් පාලන නියෝජිතයන්ට තවත් නීතියකුත් ක්‍රියාත්මකනොවිය යුතුය.

නමුත් මේ කිසිවක් නොතේරෙන අයෙකු සේ ඔබතුමිය කල වැරැද්ද පසෙක තබා මාහට චෝදනා කිරීම කොතරම් සාධාරණද යන්න සිතා බලන මෙන් ඉල්ලමි.ඇතැම්විට ඔබ තුමියගේ දේශපාලන පරිනතභාවය මත ඔබතුමිය ගත්තීරණය නිවැරදි තීරණයක් ලෙස ඔබතුමිය විග්‍රහ කලද, පක්ෂය ගනු ලබන පොදු තීරණය සුරකීම අප සැමගේම වගකීමක් බවටත්, එය කඩකිරීම විනය විරෝධීකටයුත්තක් බවටත් ,තර්කයක් තිබිය නොහැක.

පක්ෂය විසින් ගන්නා තීරණයන් ක්‍රියාත්මක කිරීමට කටයුතුකිරීමේදී විවිධ දෝෂාරෝපන හා දොස්පැවරීම්වලට ලක්වීම ස්වාභාවික බව මා හොදින් අවබෝධකරගෙන ඇත.කෙතරම් නිවරදි තීරණයක් සම්බන්ධයෙන්වුවද විවේචන තිබිය හැක.ඔබ තුමිය ඇතුලු පිරිසක් සජිත් ප්‍රේමදාස මහතා ජනාධිපතිවරණයේදී ජයග්‍රහණයකරවීමට කටයුතු කිරීම මත, ඔවුන්ට එරෙහිව නීතිමය වශයෙන් කටයුතු කරන විට, එම පාර්ශවය මා සමග ඇතිකරගන්නා වෛරයත් පොදුජන පෙරමුණ සමග ඇතිකරගත් ගිවිසුමේ කොන්දේසි කඩකරනවිට ඒ පිළිබද අදහස් දැක්වීමේදී එම පාර්ශවයේ නායකයන්ගේ උදහස්වීම් සහ මා හට කරන පහරදීම් අප ආදරණීය පක්ෂය වෙනුවෙන් ඉවසන්නට මා පුරුදුවී සිටිමි.

2021.02.25.දින පැවැති පක්ෂයේ විධායක සභාව කැදවීම මා විසින් නිවරදිව කර ඇත.විධායක කාරක සභාව සදහා කැදවන අයගේ නාම ලේඛණය මධ්‍යම කාරක සභාව විසින් අනුමත කර ඇත.එම රැස්වීමේ තොරතුරු සියල්ල මැතිවරණ කොමිසමට යැවිය යුතු බැවින් පක්ෂයේ මාධ්‍ය අංශයේ ඡයාරූප ශිල්පියකු හා වීඩියෝ කැමරා ශිල්පියකු එහි සියලු කටයුතු ආවරණය කරන ලදී.

පක්ෂයේ ව්‍යවස්ථාපිත සංවිධානවල විශේෂ රැස්වීම් කැදවීමේ බලය 15 (1) (ආ) වගන්තියෙන් පක්ෂයේ සභාපතිවරයාට හිමි බලයකි.එම විධායක රැස්වීම්වලට අදාල කැදවීමේ ලිපි සභාපතිතුමාගේ අත්සනින් යැවිය යුතුයැයි පක්ෂ ව්‍යවස්ථාවේ කිසිදු තැනක සදහන්ව නැත.මෙම සැම කැදවීමක්ම ඉතිහාසයේසිට කර ඇත්තේ සභාපතිවරයාගේ නියෝගය මත ප්‍රධාන ලේකම්වරයා විසිනි.ඉහත විධායක සභාවද කැදවනලද්දේ සභාපතිතුමා විසින් මාවෙත ලබාදෙන ලද උපදෙස් පරිදිය.එබැවින්

ඔබතුමිය විසින් කරුණු දක්වන විධායක සභාවද කැඳවීම මාගේ අත්සන සහිත ලිපියකින් සිදුවීම තුලින් කිසිදු වරදක් සිදුව නොමැත.

2021.02.25 දින පැවැත්වූ නිලවරණය හා නව නිලධාරීමණ්ඩලය පත්කරගැනීම නීත්‍යානුකූලය.පක්ෂ ව්‍යවස්ථාවේ 12 වන වගන්තියට අනුව කලින් පත්වතිබූ නිලධාරීමණ්ඩලය ඉල්ලා අස්වූ අතර පක්ෂයේ සභාපතිතුමා ලෙස නැවත වරක් ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විධායකසභාවේ යෝජනා ස්ථිරත්වයෙන් පත්විය.සෙසු නිලධාරී මණ්ඩලයද නීත්‍යානුකූලව පත්කරගෙන ඇත.

පක්ෂයේ විධායක සභාවේ නීත්‍යානුකූල කාර්යයාභාරය අවසන්වූ පසු පැමිණසිටි විධායක සභිකයන්ට රාත්‍රිභෝජන සංග්‍රහයක් පැවැති අතර සමස්ථ විධායක සභිකයන්ද ඔවුන් සමග පැමිණි පිරිස්ද ආහාර ගන්නා ලදී.මාගේ පුද්ගලික කාර්යාමණ්ඩලය නොව පක්ෂයේ කාර්යාමණ්ඩලය හා එම ජයාරූප ශිල්පීන් ද මාධ්‍ය කටයුතුවල නිරත පිරිස්ද එම අවස්ථාවට එක්විය.එම පිරිස කැඳවා විධායක සභාවේදී ජන්දය ලබාගත්තේයන්න සම්පූර්ණයේනම ප්‍රලාපයක්වන අතර එවන් තත්වයකට පක්ෂය පත්වනැතිබව දැන්විය යුතුවාසේම, විශ්වාසදායක නොවන මුලාශ්‍ර වලින් ලබාගන්නා තොරතුරු , කේලාම් හා ඕපාදූප මත පිහිටා මෙලෙස අසත්‍ය තොරතුරු සමාජගත කිරීම ඔබ වැනි නායිකාවකට තරම් නොවන බව කාරුණිකව දැන්විය යුතුය.

2021.04.05 දින පවත්වන්නට නියමිතව තිබූ සමස්ථ ලංකා කාරක සභාව කල් දැමීමට පක්ෂය විසින් තීරණය කරණ ලද අතර එදින විශේෂ පාර්ලිමේන්තු දිනයක් ලෙස නම්කිරීම ඊට හේතුවිය. සාමාන්‍යයෙන් සඳුදා දින පාර්ලිමේන්තුව කැඳවන්නේ නැතිවුවද එදින විශේෂ පාර්ලිමේන්තු දිනයක් ලෙස නම්කරන ලදී.පක්ෂයේ ව්‍යවස්ථාව අනුව නිවරදිව මෙම රැස්වීම කැඳවා තිබුණි.එම රැස්වීම සඳහා ඔබට ආරාධනා නොකිරීම මත එම රැස්වීම අනීතික වන්නේ නැත.පක්ෂයේ මධ්‍ය සංවිධාන සියළු ආසන වල පිහිටුවා ඇත.එබැවින් නුදුරු දිනකදී පක්ෂයේ සමස්ථ ලංකා කාරක සභාව පවත්වා අවසන්කිරීමට බලාපොරොත්තු වේ.

ඔබ තුමිය විසින් එවන ලද ලිපියට ප්‍රමාණවත් පරිදි කරුණු ඉහත දැක්වූයෙමි.මීට අමතරව වෙනත් යම්කිසිකරුණක් දැනගැනීමට අවශ්‍යනම් මා ඇමතීමට කාරුණිකවන ලෙස ඉල්ලා සිටිමි.


මෙම ඇතිවී ඇති ගැටළුව ඔබ තුමිය විසින් පක්ෂයේ ගරු සභාපතිතුමා ප්‍රධාන නිලධාරීමණ්ඩලය සමග සාකච්ජාකර විසඳා ගත යුතු ගැටළුවකි.අප චන්ද්‍රිකා මැතිණිය පක්ෂයට ගන්නවා කියා කියන්නේ ඇයිද යන්න ඔබ තුමියට වැටහෙනු ඇතැයි සිතමි.ඔබ තුමියගේ ආදරණීය පියාණන්වූ අප පක්ෂයේ නිර්මාත්‍ය ගරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මැතිතුමාගේ ලේ වලින් පෝෂණය වූ ඔබ ආදරණීය මැණියන් දශක ගණනාවක් නොසැලෙන ධෛර්යයයෙන් රැකගත් මෙම

පක්ෂයට ඔබගේ නැවත පැමිණීම ගෞරවයක් සේ සලකමි.ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වටා ජනතාව නැවත පෙලගැසෙන මේ මොහොතේ අප කල යුත්තේ අපගෙන් ගිලිහී ගිය සියළු බලවේග නැවත අප වටා ඒකරාශීකරගනිමින් බලයෙන් උද්දච්ජ නොවී අප සමග සිටින සියළුපාර්ශවයන්ට ඇහුම්කන්දෙමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ රජයක් බිහිකිරීමට කැපවීමත් ඒ තුලින්, වසර 70 ක කාලයක් තුල අසරණව ඇති අප මාතෘභූමිය සංවර්ධිත දේශයක් ලෙස ගොඩ නැගීමට එකාවන්ව කටයුතුකිරීමය.ඒ වෙනුවෙන් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා ලෙස මා ඕනෑම කැපකිරීමක් කිරීමට සූදානම්බවද ,ඔබ තුමිය සමග කිසිදු පෞද්ගලික හෝ දේශපාලන කෝන්තරයක් නැතිබවද, ප්‍රකාශකරමි. මෙම පක්ෂය යලි බලයට ගෙන ඒමේ අවංක උවමනාව පමණක් මා තුල ඇති බව දැන්වීමටද කැමැත්තෙමි.

පක්ෂයේ ලේකම්වරයා හැම විටම අන්අයගේ දෝෂාරෝපනයට ලක්වන්නෙකි.මා එය බලාපොරොත්තු විය යුතුය. පක්ෂය ජයග්‍රහණයකරා ගෙනයන්නට වැඩකරන විට ඇතිවන අතපසුවීම්, මග හැරීම් වලදී පලමුව පක්ෂයේ ලේකම්වරයා දෝෂදර්ශනයට ලක්වේ.පක්ෂයේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් එම සෑම තත්වයකටම මා නිදහස් මනසකින් යුතුව මුහුණදෙමි.

මෙම පිළිතුරු ලිපියෙන් ඔබ තුමියට යම් සිත්රිදවීමක් ඇතිවුයේනම් එයට මාගේ කණගාටුව ප්‍රකාශකර සිටිමි.

ස්තුතියි
මෙයට-විශ්වාසී



නීතීඥ දයාසිරි ජයසේකර (පා.ම )
ප්‍රධාන ලේකම්

පිටපත් -01 පක්ෂයේ ගරු සභාපති, 6 වන විධායක ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
02 ගොණුවට